# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. — ඔබේ අංකය / உமது இல. / Your No. — දිනය / திகதி / Date 2022/01/10

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | = | ඩබ්ලිව්.ජ්.ඩී.ටී.ඩී. ජයරත්න මිය.<br>අංක : 21/2, මාවත්ගම,<br>හෝමාගම. |
| අගතියට පත් පාර්ශවය | - | ඩබ්ලිව්.ජ්.ඩී.ජයරත්න |
| වගඋත්තර පාර්ශවය | - | 01. පො.සැ. 10836 ගලගෙදර මහතා,<br>පොලිස් ස්ථානය,<br>හෝමාගම.<br><br>02. පො.කො. 50001 කමල්සිරි මහතා,<br>පොලිස් ස්ථානය,<br>හෝමාගම. |
| <u>පැමිණිලි අංකය</u> | - | **<u>HRC/1729/18</u>** |

පැමිණිල්ල :-

උක්ත පැමිණිලිකාරිය සිය පැමිණිල්ල මගින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2018.07.30 දින තම නිවස ආසන්නයේ ඇති වෙනත් නිවසක් ඉදිරිපිට යම් පුද්ගලයෙකු සිට ඇති අතර, එම පුද්ගලයා තම පියා බවට සැකකොට රාත්‍රි 12.00 ට පමණ පොලිස් නිලධාරීන් විසින් තම පියා වන ඩබ්ලිව්.ජ්.ඩී. ජයරත්න යන අයව හැද සිටි සරම පිටින් අදාළ නිවස ඉදිරිපිටට ගෙන ගොස් පහරවල් 4, 5 ක් ගසා පොලිසියට රැගෙන යන ලද බවත්, පොලිස් ස්ථානයේදී තම පියාට අමානුෂික අන්දමින් පහරදී ඇති බවත් ය.

අගතියට පත් ඩබ්ලිව්.ජ්.ඩී. ජයරත්න යන අය සඳහන් කර ඇත්තේ, 2018.07.30 දින මධ්‍යම රාත්‍රී 12.00 ට පමණ පොලිස් නිලධාරීන් තිදෙනෙක් තම නිවසට පැමිණ 'තමා වෙනත් නිවසකට ගිය බවට' පවසා බිරිඳ සහ දරුවන් ඉදිරියේදී පහරදී තමාට විරුද්ධව පැමිණිලි කළ පාර්ශවයේ නිවසට රැගෙන ගොස් එහිදී ද පහරදී පසුදින අධිකරණය වෙත ඉදිරිපත් කළ බවයි. පසුව අධිකරණයෙන් තමාව නිදහස් කළ බවද, මෙම පහරදීම නිසා හෝමාගම රෝහලට ඇතුළු වී ප්‍රතිකාර ලබාගෙන 2018.07.31 වන දින රෝහලෙන් පිටව ගිය බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson — 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail — sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone — 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary — 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline — 1996
වෙබ් / இணையம் / Web — www.hrcsl.lk

පැමිණිල්ල තහවුරු කිරීම සඳහා හෝමාගම රෝහල වෙතින් අධිකරණ වෛද්‍ය වාර්තාව කැඳවා ඇති අතර, එම වාර්තාවට අනුව රෝගියා විසින් ලබා දෙනු ලබන කෙටි රෝග ඉතිහාසයේ 'තමාට පොලිස් නිලධාරීන් විසින් පහරදීමක් කළ බවට දක්වා ඇති බව නිරීක්ෂණය වේ. එසේම වෛද්‍ය වාර්තාවට අනුව බරපතල නොවන තුවාල 3 ක් ඇති බවද සඳහන් වේ.

එනම්, පළමු තුවාලය වශයෙන් සෙ.මී. 4 ක ප්‍රමාණයෙන් යුතු වම් කකුලේ පහළ කොටසේ කැපුම් තුවාලයක් ඇති බවත්, එයට මැහුම් යොදා ඇති බවත්,

දෙවන තුවාලය වශයෙන් සෙ.මී. 2 ක් දිගැති සෙ.මී. 0.5 ක් පළල වම් උරහිසෙහි පිටුපස තැලීම් තුවාලයක් ද,

තුන්වන තුවාලය වශයෙන් සෙ.මී.1 දිග සෙ.මී. 1 ක් පළල පිටෙහි තැලීම් තුවාලයක් ද දක්නට ඇති බව වෛද්‍ය වාර්තාවේ සඳහන් කර ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

01 වන වගඋත්තරකාර පොලිස් සැරයන් ගලගෙදර යන අය කොමිෂන් සභාව ඉදිරියේ කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, 2018.07.29 වන දින රාත්‍රියේ ජංගම සංචාර කටයුතු වල යෙදී සිටි අතර, එම ජංගම සේවය භාර නිලධාරියා ලෙස තමා කටයුතු කළ බවත්, ඒ අනුව පො.කො. 50001 කමල්සිරි සහ පො.කො.රි. 3967 දීපන් යන නිලධාරීන් සමග අදාළ ජංගම මුර සේවයේ යෙදී සිටි බවත්ය. එදින රාත්‍රී 11.00-11.30 ට පමණ 119 දුරකථනයට ලද පැමිණිල්ලක් පොලිසිය විසින් ජංගම සේවයට දැනුම්දුන් බවත්, එහි දක්වා තිබුනේ .පුද්ගලයෙකු නිවස අසල රැඳී සිට පැනගිය බවත්, ඔහු හඳුනාගත හැකි බවත්.ය. ඒ අනුව අදාළ ස්ථානයට ගොස් එම පැමිණිලිකරුවන්ගේ මගපෙන්වීම මත එම නිවස අසල පදිංචිව සිටි අංක : 21/1, සුහසිංහ මාවත, හෝමාගම පදිංචි වික්‍රමසිංහ ආරච්චිගේ දොන් ජයරත්න යන අයව අයුතු ඇතුළුවීම යන වරද කියාදී අත්අඩංගුවට ගත් බව සඳහන් කර ඇත.

වැඩිදුර විමර්ශන හෝමාගම පොලිස් ස්ථානයේ සුළු පැමිණිලි අංශයේ ස්ථානාධිපතිවරයා විසින් සිදුකොට අදාළ සැකකරුව එදිනම අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබූ බවත්, ඔහුට විරුද්ධව දැනට හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 20594/18 යටතේ නඩුවක් ගොනු කර ඇති බවත් සඳහන් කර ඇත. මොහුට කිසිදු පහරදීමක් නොකළ බවද සඳහන් කර ඇත.

සැකකරු අත්අඩංගුවට ගැනීමට යාමේදී අත්අඩංගුවෙන් පලායාම හෝ අත්අඩංගුවට ගැනීම වැළැක්වීම සඳහා කටයුතු කළේද යන්න විමසීමේදී 1 වන වගඋත්තරකරු පිළිතුරු ලබාදී ඇත්තේ නිවසට ගොස් කථා කළ අවස්ථාවේදී දොර විවෘත නොකළ බවත්, නමුත් ටික වේලාවකට පසුව දොර විවෘත කළ බවත්, එහිදී සැකකරු හඳුනාගැනීමෙන් පසුව අත්අඩංගුවට ගත් බවත්ය.

දෙවන වගඋත්තරකාර පො.කො. 50001 බී.ඒ. කමල්සිරි යන අය ප්‍රකාශ කර ඇත්තේ, 2018.07.30 දින රාත්‍රී 119 දුරකථනයට ලද ඇමතුමක් අනුව නාඳුනන පුද්ගලයෙකු නිවසක් අසල රැඳී සිටින බවත්, ඔහුව අත්අඩංගුවට ගැනීමට කටයුතු කරන ලෙසට දැනුම්දුන් බවත්, ඒ අනුව තමා සහ

පො.කො. ගලගෙදර යන අය ජීප් රථයෙන් එම ස්ථානයට ගිය බවත්, එම අවස්ථාවේදී සැකකාර පුද්ගලයා නොසිටි අතර, ලද තොරතුරට අනුව එම පුද්ගලයා සිටියා යැයි කියනු ලැබූ ස්ථානයේ වීදුරු කටු තිබූ බවත්, එම වීදුරු කටු වලට කැපීම නිසා ලේ වහනය වීමක් සිදුව තිබූ අතර, එම ලේ පැල්ලම් ඔස්සේ සොයා බැලීමක් කරනවිට සැකකරුගේ නිවස හඳුනාගත් බවත්ය. එය එම ස්ථානයට ඉතා ආසන්නව ඇති නිවසක් බවත්, අදාල තොරතුරු ලබාදුන් අය සමග එම නිවසට ගොස් නිවැසියන්ට දොර අරින ලෙසට දැනුම්දුන් නමුත්, දොර ඇරීමට ප්‍රමාද වූ බවත් පැය හායකට පමණ පසුව දොර ඇරිය බවත්, මෙම සැකකරුගේ කකුලේ යටි පැත්තේ තුවාලයක් තිබූ අතර, එය රෙදි පටියකින් වෙලා තිබූ බවත්, එම සැකය මත මෙම පුද්ගලයා අත්අඩංගුවට ගත් අතර, පොලිස් ස්ථානයට රැගෙන ගොස් ඉදිරිපත් කිරීමෙන් පසුව වෙනත් නිලධාරියෙක් ඔහුගෙන් ප්‍රකාශ සටහන් කර ගත් බවත් සඳහන් කර ඇත. ඒ අනුව රාත්‍රී කාලයේදී ඉඩමකට අයුතු ඇතුළුවීම යටතේ හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණය වෙත බී 20594/18 යටතේ ඉදිරිපත් කර පසු ඇප මත මුදා හැරිය බවත් දක්වා ඇත.

කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රශ්න කිරීමේදී ලබාදුන් පිළිතුරු අනුව පහරදීම සම්බන්ධයෙන් චෝදනාව ප්‍රතික්ෂේප කරන අතර, අත්අඩංගුවට ගැනීමේදී අත්අඩංගුවට ගැනීමට විරුද්ධව විරෝධතාවයක් නොදැක්වූ බවත්, පැනයාමට උත්සහ නොකළ බවත් සඳහන් කර ඇත. උපසේවයට භාරදෙන අවස්ථාවේදී යටි පතුලේ තුවාලයක් හැර වෙනත් තුවාල දක්නට නොවූ බවද සඳහන් කර ඇත.

වෛද්‍ය වාර්තාව අනුව කකුලේ යටි පතුලේ ඇති තුවාලයට අමතරව තවත් තුවාල 02 ක් ඇති බවට සඳහන් වීම සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමේදී ඒ සම්බන්ධයෙන් කිසිවක් තමන් නොදන්නා බව දෙවන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත. තවද, වෙනත් නිලධාරියෙක් විසින් හෝ ඔහුට පහරදීමක් සිදුනොකළ බවද සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :-**

වගඋත්තරකරුවන් විසින් ඩබ්ලිව්.ජී. ජයරත්න යන අයව 2018.07.30 දින අත්අඩංගුවට ගෙන ඇති බවත්, 2018.07.31 දින අයුතු ඇතුළුවීම යන චෝදනාව මත අංක : බී 20594/18 යටතේ හෝමාගම අධිකරණය වෙත ඉදිරිපත් කර එම නඩුව මේවනවිට ද විභාග වෙමින් පවතින බවත් නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ අනුව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී සැකකරුගේ වම් කකුලේ යටි පතුලේ එක් තුවාලයක් හැර වෙනත් තුවාල නොතිබූ බවට නිරීක්ෂණය වේ.

අත්අඩංගුවට ගැනීමට යාමේදී ඊට විරුද්ධව විරෝධය පෑමක් හෝ අත්අඩංගුවෙන් පලායාමට තැත් කිරීමක් සිදුව නැති බවද නිරීක්ෂණය වේ. මෙම අය අත්අඩංගුවට ගෙන ඇත්තේ 2018.07.30 දින මධ්‍යම රාත්‍රියේ දී වන අතර, අධිකරණ වෛද්‍ය පරීක්ෂණයක් සඳහා යොමු කර ඇත්තේ 2018.07.31 වන දිනය. ඒ අනුව අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි තුවාල තුනක් ඇති බව සඳහන් වන අතර, වම් කකුලේ තුවාලය හැර තවත් තුවාල දෙකක් ඇති බවට නිරීක්ෂණය වේ. තවද, පැමිණිලිකරු දක්වා සිටින පරිදි පහරදුන් ආකාරය සහ මෙම තුවාල සැසදෙන බව නිරීක්ෂණය වේ. මෙයින් එක් තුවාලයක් අත්අඩංගුවට ගැනීමට පෙර සිදුවූ තුවාලයක් බව නිරීක්ෂණය වී ඇති බැවින්, ඊට අමතරව අත්අඩංගුවට ගත් අවස්ථාවේදී හෝ ඉන් පසුව අනෙක් තුවාල දෙක සිදුවූ

බවට තිරීක්ෂණය වන බැවින්. ඒ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් නිලධාරීන් වගකිව යුතු බවට නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 14 වන වගන්තිය අනුව කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාව වෙත ලැබී ඇති පැමිණිල්ලක් මත මෙම පරීක්ෂණය සිදුකර ඇත. ඒ අනුව පනතේ 15 වන වගන්තිය අනුව මානව හිමිකම් උල්ලංඝනය වීමක් හෙළිදරව් වී ඇත.

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව අනුව 'කිසිදු තැනැත්තෙකුව වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවට' සහතික කර ඇති අතර. වින්දිතයාට වගඋත්තරකරුවන් විසින් පහරදුන් බවට තහවුරු වීම තුළින් අදාළ වින්දිතයාගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

<u>කමල් සුදත් එරෙහිව කොඩිතුවක්කු</u> නඩුවේදී අධිකරණය විසින් සඳහන් කර ඇත්තේ. කිසියම් පුද්ගලයෙකු අපරාධකරුවෙකු වුවද. ඔහුට වධහිංසාවෙන් මිදීමට නිදහස ඇති බවත්. කිසිදු අවස්ථාවක කිසියම් තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අවමන් සහගත දඬුවමකට හෝ යටත් නොකළ යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය මගින් විධානය කරන බවත්. යම් තැනැත්තෙකු විසින් තවත් තැනැත්තෙකුට වධහිංසා හෝ කෲර අවමන් සහත සැලකිල්ලක් දැක්වීම මෙම ව්‍යවස්ථාව මගින් තහනම් කර ඇති බවත්ය.

එසේම. වධහිංසාවකට භාජනය කිරීම තුළින් 'මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ' 5 වන වගන්තියේ මෙන්ම 'සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ' 7 වන වගන්තියේ සහ 'වධදීම සහ අනෙකුත් කෲර අමානුෂික ලිංගික සැලකිල්ලකට හෝ දඬුවමකට එරෙහිව වූ ජාත්‍යන්තර සම්මුතින්' ද උල්ලංඝනය වන බවයි.

**නිර්දේශය :-**

01. ඒ අනුව වගඋත්තරකරුවන් විසින් වින්දිතයා වෙත රු. 10,000/- ක වන්දි මුදලක් ගෙවිය යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. තවද. වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා පොලිස්පති වෙත ද මෙහි පිටපතක් යොමු කරනු ලැබේ.

2022.෦෭.1෦ වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා සන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- අධ්‍යක්ෂක,
මානව හිමිකම් කොට්ඨාශය,
එන්.එම්.පෙරේරා මාවත,
කොටා රෝඩ්,
කොළඹ 08.

සැ.යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මඟින් පැමිණිලිකාරිය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැළැස්විය යුතුය.

B/-